# Covid 19- සති පාසල

# 10 ශ්‍රේණිය ඉතිහාසය

**4.2 ආර්ථිකය (රැකිරක්ෂා සහ වෘත්තීන්)**

**4.3 සංස්කෘතිය (ආගම,වෙනත් ආගම්)**

- ➢ අතීතයේ දී විවිධ රැකිරක්ෂා සහ වෘත්තීන් රැසක් පැවතුණි. ගුරුවරු,වෛද්‍යවරු, නීති විශාරදයන් සහ නැට්ටුවන් චිත්‍ර අඳින්නන් හා කවියන් ආදී ශිල්පීන් ඒ අතර වූහ.
- ➢ මහින්දාගමනයේ සිට බුදු දහම මෙරට ප්‍රධාන ආගම විය. රාජ අනුග්‍රහය ඊට නොමදව ලැබුණු අතර ආරාම හා විහාර ඉදි කරමින් ඔවුහු බුදු දහම නගා සිටුවූහ.
- ➢ ග්‍රාමීය ජනතාවගේ ආගමික කටයුතු පන්සල හෙවත් පණ්ණසාලා මුල්කොටගෙන සිදු වු අතර අන්තේවාසික,සද්ධි විහාරික,ථෙර,භාණකවරු ආදී භික්ෂූන් වහන්සේලා රැසක් එහි වාසහ කළහ. කඨින චීවර පූජා ද පුරාණයේ සිටම සිදුකර තිබේ.
- ➢ බුදු දහමට අමතරව හින්දු ආගම, කතෝලික ආගම, ඉස්ලාම් ආගම ආදී අනෙකුත් ආගම් ද බොහෝ කාලයක සිට මෙරට සමාජය තුළ පැවති බවට සාධක රැසක් පවතී.

**ක්‍රියාකාරකම්**

1 අතීතයේ මෙරට සමාජය තුළ විවිධ රැකිරක්ෂා සහ වෘත්තීන්හි නියැලුණු ජනතාවක් සිටි බව කරුණු තුනක් ඇසුරින් උදාහරණ සහිතව විමසන්න.

2 පැරණි ශ්‍රී ලංකාවේ මෙරට සමාජය තුළ බුදු දහමේ ක්‍රියාකාරිත්වය පිළිබඳව පහත අංශ යටතේ තොරතුරු දක්වන්න.

- ❖ ආරාම ඉදිකිරීම
- ❖ පණ්ණසාලා හෙවත් පන්සල
- ❖ විවිධ නාමයන් හා තනතුරු වලින් හැඳින්වූ භික්ෂූන්වහන්සේලා සිටීම
- ❖ පිංකම් සිදු කිරීම

3 ඉතා ඈත අතීතයේ සිට හින්දු, කතෝලික සහ ඉස්ලාම් යන ආගම් මෙරට පැවති බවට ලැබෙන සාධක ඇතුලත් කරමින් වගුවක් සකස්කරන්න.

4 පහත සඳහන් සියලු ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

- ❖ මාගම,දේවනගර,කදුරුගොඩ,අනුරාධපුර,මැදිරිගිරිය,නාගදීපය,පොළොන්නරුව, හම්බන්තොට,මහියංගනය,මිහින්තලය,සීගිරිය,කුරුණෑගල

5 පහත සඳහන් සියලු ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

- ❖ රෝමය,චීනය,කාලිංගය,පාණ්ඩ්‍ය දේශය,අරාබිය, කාම්බෝජය(ඇෆ්ගනිස්ථානය),පර්සියාව, ග්‍රීසිය, මලය අර්ධද්වීපය